# ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර හා ඒවායේ වාස්තුවිද්‍යාත්මක වැදගත්කම

ඩී.ජී.ඒ.සී. දිල්රුක්ෂි[72]

ටැම්පිට විහාර යනුවෙන් අර්ථ ගැන්වෙන්නේ ටැම් හෙවත් කුළුණු මත ඉදිකළ විහාර විශේෂයක් වේ. මහනුවර යුගයේ එනම් 17 වැනි සියවසේ සිට 19 වැනි සියවස දක්වා කාලය තුළ මෙම ටැම්පිට විහාර ඉදිකර තිබූ බවට ලිඛිත හා පුරාවිද්‍යාත්මක කරුණු මගින් සනාථ වේ. මේ වන විට පැරණි ටැම්පිට විහාර ඒ තත්ත්වයෙන් ම දැකගැනීමට නොහැකි ය. ඊට හේතුව වන්නේ ඇතැම් විහාර අළුත්වැඩියා කර තිබීම සහ ඇතැම් විහාර විනාශයට පත් වෙමින් තිබෙන නිසා ය. පැරණි ම ටැම්පිට විහාරය ලෙස දැනට හඳුනාගෙන ඇත්තේ මැදවල ටැම්පිට විහාරයයි. මෙය 14 වැනි සියවසට අයත් වේ. මෙම විහාරය මහනුවර රාජධානි සමයේ එනම් 17 වැනි සියවසේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ටැම්පිට විහාරයක් ලෙස ඉදිකළ බව මැදවල තඹ සන්නසට අනුව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් සනාථ ව ඇත. බෞද්ධ විහාරයක ප්‍රධාන අංග වන්නේ දාගැබ, බෝධි වෘක්ෂය, උපෝසථාගාරය, ප්‍රතිමා මන්දිරය යනාදිය යි. මේ අතුරින් ප්‍රතිමා මන්දිරය ටැම්පිට විහාර සම්ප්‍රදායට අනුව නිර්මාණය වීම මහනුවර යුගයේදී සිදු වූ සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක සැලසුමක් බව පෙන්වා දීමට හැකි ය. ටැම්පිට විහාර ඉදිකිරීමේ තාක්ෂණය වෙත අවධානය යොමු කිරීම වැදගත් වේ. අඩි 2-3 ක් පමණ උස කුළුණු මත අඟල් 2-3 ක් පමණ ඝනකම ලෑලි අතුරා වරිච්චි බිත්ති සකස් කර මැටි දෙමැටි ගසා සුදු හුණු හෝ මකුළු මැටි මඟින් පිරියම් කර ඇත. පියස්ස පෙති උළු සෙවිලි කර පල හතරකින් යුක්ත ව සකස් කර තිබේ. එ මෙන්ම ප්‍රදක්ෂිණා පථයකින් හා ප්‍රතිමා මන්දිරයට පිවිසීමට තරප්පු පේළියක් ද වේ. පසුකාලීන ව ටැම්පිට විහාරයට සම්බන්ධකර ධර්ම ශාලාව ඉදිකර ඇත. මාවනැල්ල එරමිණිගම්මන ටැම්පිට විහාරය, රඹුක්කන මාලියැද්ද ටැම්පිට විහාරය ආදී විහාරයන්ගේ මෙම වාස්තු විද්‍යාත්මක අංග හඳුනාගැනීමට හැකි විය. ටැම්පිට විහාර ඉදිකිරීම සඳහා දළදා මැඳුරුවල බලපෑම, තෙතමනයෙන් හා වේයන්ගෙන් ආරක්ෂා කර ගැනීම, ප්‍රතිමා මන්දිරයට ගාම්භීර පෙනුමක් ලබාදීම යනාදිය බලපා ඇති බව විශ්වාස කෙරේ. ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම්, මූර්ති, බිතු සිතුවම් මඟින් ටැම්පිට විහාරය කුඩා කලාගාරයක් ලෙස හඳුන්වනු ලැබේ. ටැම්පිට විහාරයන් වැඩි වශයෙන් කෑගල්ල දිස්ත්‍රික්කය තුළින් වාර්තා වේ. වයඹ, සබරගමුව, බස්නාහිර පළාත් තුළ මෙම විහාර හඳුනා ගැනීමට හැකි ය. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, වාස්තුවිද්‍යාත්මක අගයන් මේ ටැම්පිට විහාර තුළින් ප්‍රමුඛව හඳුනා ගැනීමට හැකි අගයන් වේ. මෙම අධ්‍යනයේ දී ප්‍රාථමික මූලාශ්‍ර සහ ද්විතික මූලාශ්‍ර භාවිත කරන ලදී. ඒ තුළින් විමර්ශනාත්මක ව ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර අධ්‍යයනය කිරීමට හැකි විය.

ප්‍රමුඛ පදඃ ටැම්පිට විහාර, තඹ සන්නස, ප්‍රදක්ෂිණා පථය

[72] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, Ashikadilrukshi3247@gmail.com.